**ශීර්ෂය 21 - විගණකාධිපති දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2016 වර්ෂය**

---

ශීර්ෂය 21- විගණකාධිපති දෙපාර්තමේන්තුවේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත්පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2017 අගෝස්තු 23 දින විගණකාධිපතිවරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයාගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම

---

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙනයාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරිම හා පවත්වාගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 2. ගිණුම්

--------

## 2.1 විසර්ජන ගිණුම්

-----------------

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

---------------------------

විගණකාධිපති දෙපාර්තමේන්තුව සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු. මිලියන 1,425.63 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 1,330.04 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු. මිලියන 95.59 ක් හෙවත් සියයට 6.71 ක් ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2016 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | |
| පුනරාවර්තන | 1,240.35 | 1,147.43 | 92.92 | 7.49 |
| මූලධන | 185.28 | 182.61 | 2.67 | 1.44 |
| **එකතුව** | **1,425.63** | **1,330.04** | **95.59** | **6.71** |

## 2.2 ආදායම් ගිණුම

### ඇස්තමේන්තුගත හා තථ්‍ය ආදායම

දෙපාර්තමේන්තුව විසින් 2016 වර්ෂය සඳහා අංක 20.03.02.01 දරන ආදායම් සංකේතය සඳහා රු.මිලියන 120.00 ක ආදායම් ඇස්තමේන්තු කර තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 169.01 ක ආදායම් රැස්කර තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේදී ඇස්තමේන්තුගත ආදායම රු.මිලියන 49.01 කින් හෙවත් සියයට 40.84 කින් ඉක්මවා ආදායම් රැස්කර තිබුණි. විස්තර පහත දැක්වේ.

| **2016 දෙසැම්බර් 31 දිනට** | | | **ඉක්මවීම** |
|---|---|---|---|
| **ඇස්තමේන්තුගත ආදායම** | **තථ්‍ය ආදායම** | **ඉක්මවීම** | **ඇස්තමේන්තුගත ආදායමේ ප්‍රතිශතයක් ලෙස** |
| **රු. මිලියන** | **රු. මිලියන** | **රු. මිලියන** | |
| 120.00 | 169.01 | 49.01 | 40.84 |

## 2.3 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම්

### පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්

දෙපාර්තමේන්තුවට අදාළ විෂය අංක 02101 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| **වියදම** | | **ලැබීම්** | | **හර ශේෂය** | |
|---|---|---|---|---|---|
| **උපරිමසීමාව** | **තථ්‍ය** | **අවම සීමාව** | **තථ්‍ය** | **උපරිම සීමාව** | **තථ්‍ය** |
| **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** |
| 55.00 | 54.96 | 50.00 | 52.48 | 265.00 | 215.14 |

## 2.4 පොදු තැන්පත් ගිණුම්

දෙපාර්තමේන්තුවේ 2016 දෙසැම්බර් 31 දිනට තැන්පත් ගිණුම්වල ශේෂ එකතුව රු.මිලියන 19.47ක් විය. විස්තර පහත දැක්වේ.

| තැන්පත් ගිණුම් අංකය | 2016 දෙසැම්බර් 31 දිනට ශේෂය |
| --- | --- |
| | රු.මිලියන |
| 6000/0000/00/0016/0181/000 | 16.07 |
| 6000/0000/00/0018/0084/000 | 3.39 |
| 6000/0000/00/0002/0132/000 | 0.01 |
| **එකතුව** | **19.47** |

**2.5 විගණන නිරීක්ෂණය**

විගණකාධිපති දෙපාර්තමේන්තුවේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

**3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ**

**3.1 ආදායම් ගිණුම**

විගණකාධිපතිවරයා ආදායම් ගණන්දීමේ නිලධාරී වශයෙන් අංක 20.03.02.01 දරන ආදායම් සංකේතයට අදාළ ආදායම් ඇස්තමේන්තු පිළියෙල කිරීම, ආදායම් රැස් කිරීම, ගිණුම්ගත කිරීම හා ගිණුම් ඉදිරිපත් කිරීමේ කාර්යභාරය පැවරී තිබුණි. එම ආදායම් සංකේතයට අදාළව සිදු කළ නියැදි විගණනයේ දී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) දෙපාර්තාමේන්තුව විසින් පිළියෙල කරන ලද ඇස්තමේන්තුගත සංඛ්‍යා සහ භාණ්ඩාගාරය අනුමත ඇස්තමේන්තුගත සංඛ්‍යා අතර සියයට 50 ක විචලනයක් නිරීක්ෂණය වූ අතර තථ්‍ය ආදායම අතර සියයට 55 ක විචලනයක් නිරීක්ෂණය විය.

(ආ) විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ආදායම් ගිණුමට අනුව රු.මිලියන 262.4 ක් වූ හිඟහිටි ආදායමෙන් රු.මිලියන 63.8 ක් වර්ෂ 04 ක සිට වර්ෂ 33 ක් දක්වා කාල පරාසයක් තුළ හිඟ හිටව පැවතුණි.

(ඇ) පසුගිය වාර්තාවෙන් පෙන්වා දී තිබූ රජයට අයත්ව තිබූ, ආයතන වසා දැමීම්, ඒකාබද්ධ කිරීම්, ප්‍රතිව්‍යුහගත කිරීම්, විකිණීම යනාදී හේතූන් මත දැනට ක්‍රියාත්මක නොවන ආයතනවලින් අයකරගත නොහැකි හිඟ විගණන ගාස්තු රු. 6,555,758ක මුදල සම්බන්ධයෙන් එම ආයතනවල වර්තමාන තත්ත්වය භාණ්ඩාගාර ලේකම්ට පැහැදිලි කර එම හිඟහිටි විගණන ගාස්තු කපා හැරීමට අවශ්‍ය අනුමැතිය ලබාගැනීමට කටයුතු කරන බව දෙපාර්තමේන්තුවේ විගණන ගාස්තු අංශය විසින් වාර්තා කර තිබුණද, 2017 අප්‍රේල් 30 දින වන විටත් අදාළ අනුමැතිය ලබා ගෙන නොතිබුණි.

(ඈ) ලොතරැයි දිනුම් ඇදීම අධීක්ෂණය හා විගණනය කිරීම වෙනුවෙන් දෙපාර්තමේන්තුවට ලැබිය යුතු විගණන ගාස්තු ආදායමින් අධීක්ෂණ නිලධාරින්ගේ දීමනා, එකතු කළ අගය මත බදු අඩුකිරීමෙන් පසු සමාලෝචිත වර්ෂයේදී දෙපාර්තමේන්තුව වෙත ලැබුණු රු.3,848,600 ක් වූ

ශුද්ධ මුදල දෙපාර්තමේන්තුවේ විගණන ගාස්තු ආදායමක් (20.03.02.01) ලෙස හඳුනා නොගෙන, අංක 20.03.99.00 දරන අනෙකුත් ආදායම් සංකේතය යටතේ ගිණුම්ගත කර තිබුණි.

(ඉ) විගණන ගාස්තුව සඳහා ඉන්වොයිස් කිරීමට පෙර ගණනය කරන ලද විගණන ගාස්තුව විගණිත ආයතනය අයත් රේඛීය අමාත්‍යාංශයේ අනුමැතිය සඳහා යොමු කරනු ලබන අතර, විගණිත ආයතන 49 කට අදාළව එකතුව රු.24,143,416 ක් වූ විගණන ගාස්තු අනුමැතිය සඳහා යොමුකර 2017 අප්‍රේල් 30 දින වන විට මාස 01 ක සිට වර්ෂ 08 ක් දක්වා පරාසයක කාලයක් ගතවී තිබුණද, එම අනුමැතිය ලැබී නොතිබීම නිසා විගණන ගාස්තු බිල්පත් නිකුත් කිරීමට නොහැකිවී තිබුණි.

**3.2 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

විෂය අංක 02101 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2016 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශයට අනුව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.මිලියන 2.66 ක් වී තිබුණි. එම හිඟහිටි ශේෂ අතුරින් රු.මිලියන 1.37 ක් වර්ෂ 05 කට වඩා වැඩි කාලයක සිට හිඟ හිටව පැවැත එමින් තිබුණත්, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අය කර ගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.

**3.3 මානව සම්පත් කළමනාකරණය**

**(අ) අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2016 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | **සේවක වර්ගය** | **අනුමත සේවක සංඛ්‍යාව** | **තථ්‍ය සේවක සංඛ්‍යාව** | **පුරප්පාඩු සංඛ්‍යාව** |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 335 | 266 | 69 |
| (ii) | තෘතියික මට්ටම | 1,215 | 931 | 284 |
| (iii) | ද්විතියික මට්ටම | 174 | 142 | 32 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 188 | 154 | 34 |
| | **එකතුව** | **1,912** | **1,493** | **419** |

**(ආ) පුරප්පාඩු පැවැතීම**

සමාලෝචිත වර්ෂය අවසාන වන විට දෙපාර්තමේන්තුවේ සමස්ථ පුරප්පාඩු සංඛ්‍යාව 439 ක් වූ අතර ඉන් 373 ක් විගණන කටයුතු සඳහා ඍජුවම සම්බන්ධ ජ්‍යෙෂ්ඨ හා තෘතියික මට්ටමේ නිලධාරින් වේ. මේ නිසා විගණන කටයුතු කලට වේලාවට හා කාර්යක්ෂමව සිදු කිරීමට බාධාවක් වී තිබුණි.